
# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

# 10 ශ්‍රේණිය

## කාර්ය පත්‍රිකා සංග්‍රහය



කලාප අධ්‍යාපන කාර්යාලය

අම්පාර

විෂයය :- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය ශ්‍රේණිය:- 10 ශ්‍රේණිය
පාඩම්/ඒකකය :- ව්‍යාපාර පසුබිම
ගුරුවරයාගේ නම :- එම්.ජී.දීපිකා දිල්රුක්ෂි
පාසල :- අම් / මඩවලලන්ද මහා විද්‍යාලය

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

## I කොටස

01. ව්‍යාපාර ආරම්භ වීමට බලපෑ මූලික සාධකය වන්නේ
    - I භාණ්ඩ හා සේවාය
    - II අවශ්‍යතා හා වුවමනාය
    - III අදායම් හා වියදම්ය
    - IV නෝට්ටු හා කාසිය
02. ව්‍යාපාරයක් යනු,
    - I ලාභ ලැබීමේ අරමුණින් කරනු ලබන ඕනෑම කටයුත්තකි.
    - II මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමේ ඕනෑම කටයුත්තකි.
    - III භාණ්ඩ නිෂ්පාදනය හා බෙදාහැරීමය
    - IV පුද්ගලයන් දෙදෙනෙකු විසින් ඇති කර ගන්නා ගිවිසුමකි.
03. පහත දෑ අතුරින් මිනිස් අවශ්‍යතා ලෙස සැලකිය හැක්කේ,
    - I පොත්පත්
    - II ආහාරපාන
    - III බත් හා ව්‍යංජන
    - IV සුවඳ විලවුන්
04. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු වීමට නම්,
    - I රජය භාණ්ඩ හා සේවා වල මිල පහළ දැමිය යුතුය.
    - II ජනතාවගේ අදායම් ඉහළ යා යුතුය.
    - III වෙළෙඳපල තුල භාණ්ඩ හා සේවා සුලභ විය යුතුය.
    - IV මිනිසා විසින් භාණ්ඩ හා සේවා පරිභෝජනය කල යුතුය.
05. නිෂ්පාදිත වල ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග දැක්වෙන පිළිතුර වන්නේ,
    - I තනි පුද්ගල හා හවුල් ව්‍යාපාර
    - II කුඩා පරිමාණ හා මහා පරිමාණ ව්‍යාපාර
    - III භාණ්ඩ හා සේවා සැපයීමේ ව්‍යාපාර
    - IV රජය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර
06. ව්‍යාපාරයක සැපයුම්කරුවන් යනු,
    - I ව්‍යාපාරයට අවශ්‍ය අමුද්‍රව්‍ය හා සේවා සපයන්නන් ය.
    - II ව්‍යාපාර විසින් භාණ්ඩ හා සේවා සපයන අංශ වේ.
    - III ව්‍යාපාර තුළ සේවය නියුතු පුද්ගලයන් ය.
    - IV ව්‍යාපාරයට තරඟයක් එල්ල කරන පර්ශවයන් ය.
07. නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගන්නා ගොඩනැගිලි යන්ත්‍ර සූත්‍ර ආදිය,
    - I. භූමිය නැමති නිෂ්පාදන සාධකයට උදාහරණයකි.
    - II. ප්‍රාග්ධනය නැමති නිෂ්පාදන සාධකයට උදාහරණයකි.
    - III. ශ්‍රමය නැමති නිෂ්පාදන සාධකයට උදාහරණයකි.
    - IV. ව්‍යවසාය නැමති නිෂ්පාදන සාධකයට උදාහරණයකි.

## II කොටස

01.අවශ්‍යතා හා වුවමනා වල වෙනස්කම් ලැයිස්තුගත කරන්න

I.අවශ්‍යතා හා වුවමනා වලට නිදසුන් 4 බැගින් ලියන්න.

II.බාටර් ක්‍රමය , විශ්ව ගම්මාන , ඇල්මැති පාර්ශවය යන සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

02.භණ්ඩ හා සේවා වල ලක්ෂණ ලැයිස්තුගත කරන්න.

I.ලාභ අපේක්ෂිත ව්‍යාපාරයක අරමුණු 4 ක් ලියන්න.

II.ඔබේ නිවසට ගෙන එන භාණ්ඩ 5ක් සැලකිල්ලට ගෙන ඒවා ඔබ අතට පත් වූ ආකාරය ලියා දක්වන්න.

III.අතීතයේ අවශ්‍යතා හා වුවමනා ඉටුකරගත් ආකාරයත් වර්ථමානය ඉටුකර ගන්නා ආකාරයත් අතර වෙනස්කම් දක්වන්න.

03. පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

I.භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා ව්‍යාපාර විසින් යොදා ගන්නා සම්පත් නිෂ්පාදන සාධක ලෙස හැඳින් වේ.

II.ගෘහ භණ්ඩ නිෂ්පාදනයේදී යොදා ගන්නා දැව, භූමිය යටතට අයත් වේ.

III.සනීපාරක්ෂක කම්කරුවෝ මානසික ශ්‍රමයට උදාහරණයකි.

IV.නිෂ්පාදනයට ආධාර කර ගන්නා මිනිසා විසින් නිර්මාණය කර ගන්නා දෑ ව්‍යවසාය ලෙස හැඳින් වේ.

04.ව්‍යාපාරක් කෙරෙහි ඇල්මැත් පාර්ශව 4ක් ලියන්න

I.ඔබේ පාසලේ ඇල්මැති පාර්ශව ලෙස නම් කල හැකි පාර්ශව 2ක් ලියා එසේ ඇල්මක් දක්වන්නේ ඇයිදැයි ලියන්න.

05.සේවා සපයන ව්‍යාපාර ආයතන 3ක් ලියන්න.

I.පහත සඳහන් භාණ්ඩ වර්ග සඳහා සන්නම් නාම 2 බැගින් ලියන්න.

| | | |
|---|---|---|
| සබන් | දත් බෙහෙත් | තේ කොල |
| යතුරු පැදි | ශීතකරන | අභ්‍යාස පොත් |

II.ශ්‍රී ලංකාවේ කාන්තාවන් සේවා සපයන ව්‍යාපාර වල නිරත වීම බහුලව දක්නට ලැබේ. එසේ කාන්තාවන් නිරත වන සේවා අංශයේ ව්‍යාපාර ක්ෂේත්‍ර 04 කට නිදසුන් දක්වන්න.

| | |
|---|---|
| පාඩම්/ඒකකය -: ව්‍යාපාර පරිසරය | විෂය -: ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය 10 ශ්‍රේණිය |
| ගුරුවරයාගේ නම -: S.A.මල්ලිකා පෙරේරා | පාසල -: අම්/බණ්ඩාරනායක බා.ජා.පා. |

## I කොටස

01.ව්‍යාපාර කටයුත්තක් පවත්වාගෙන යැමේදි ඊට බලපෑම් ඇති කරන විවිධ සාධක ක්‍රියාත්මක වන වටපිටාව හඳුන්වන්නේ,

I බාහිර පරිසරය　　II අභ්‍යන්තර පරිසරය

III ව්‍යාපාර පරිසරය　　IV පරිසරය

02.ව්‍යාපාර පරිසරයට අයත් වන අයිතිකරුවන් , කළමනාකරුවන් හා සේවකයන් සිටින්නේ කවර පරිසරයකද ?

I අභ්‍යන්තර පරිසරය　　II බාහිර පරිසරය

III තාක්ෂණික පරිසරය　　IV ආර්ථික පරිසරය

03.ගනුදෙනුකරුවන් ,සැපයුම්කරුවන් හා තරඟකරුවන් සිටින්නේ කවර පරිසර තත්වයක ද?

I බාහිර පරිසරය　　II අභ්‍යන්තර පරිසරය

III දේශපාලන පරිසරය　　IV ගෝලීය පරිසරය

04.පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත , සමාගම් පනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යනාදි පනත් සඳහා වැදගත් වන පරිසරය වන්නේ,

I දේශපාලන　　II නෛතික

III ආර්ථික　　IV තාක්ෂණය

05.වර්ථමානයේ දී බොහෝ ව්‍යාපාරික කටයුතු හා පුද්ගල ජීවන රටා සඳහා බෙහෙවින්ම වැදගත් වී ඇති පරිසරය වන්නේ,

I තාක්ෂණික පරිසරය　　II දේශපාලන පරිසරය

III බාහිර පරිසරය　　IV අභ්‍යන්තර පරිසරය

06.රටක ආර්ථික ප්‍රතිපත්ති තීරණය කිරීමේ දී වැදගත් වන පරිසරය වන්නේ,

I දේශපාලන　　II ආර්ථික

III නෛතික　　IV තාක්ෂණික

07.ව්‍යාපාරයක ශක්තීන් හා දුර්වලතා හඳුනා ගත හැකි පරිසරය වන්නේ,

I බාහිර පරිසරය　　II අභ්‍යන්තර පරිසරය

III ආර්ථික පරිසරය　　IV දේශපාලන පරිසරය

08.ව්‍යාපාරයකට අවස්ථා හා තර්ජන හඳුනා ගත හැකි පරිසරය වන්නේ,

I අභ්‍යන්තර පරිසරය II බාහිර පරිසරය

III නෛතික පරිසරය IV තාක්ෂණික පරිසරය

09.තාක්ෂණික දැනුම යාවත්කාලීන නොවීම අයත් වන්නේ,

I ශක්තීන් II දුර්වලතා

III අවස්ථා IV තර්ජන

10.තරඟකරුවන් බිහිවීම අයත්වන්නේ,

I ශක්තීන් II දුර්වලතා

III අවස්ථා IV තර්ජන

II කොටස

01.ව්‍යාපාර පරිසරය කෙටියෙන් හඳුන්වා එහි ප්‍රධාන කොටස් සටහනකින් දක්වන්න.

I.බාහිර පරිසර සාධක 3ක් ලියා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

II.අභ්‍යන්තර පරිසර සාධක 3ක් ලියා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

02.තාක්ෂණික පරිසරය ව්‍යාපාර වලට බෙහෙවින් බලපා ඇත. මෙම ප්‍රකාශය තහවුරු කිරීමට හේතු 2ක් ලියන්න.

I.තාක්ෂණික වෙනස්වීම් මත ව්‍යාපාර වල සිදුවිය හැකි වෙනස්කම් 3ක් ලියන්න.

II.විද්‍යුත් තැපැල (email), ගෝලීයකරණය යන සංකල්ප පැහැදිලි කරන්න.

III.ගෝලීයකරණ සංකල්පයේ හිතකර හා අහිතකර බලපෑම් 2 බැගින් ලියන්න.

03.රටක දේශපාලන පරිසරය ව්‍යාපාර කෙරෙහි බලපාන්නේ කෙසේදැයි කෙටියෙන් පහැදිලි කරන්න.

I.ව්‍යාපාරිකයකුට ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමේ වැදගත්කම පහදන්න.

II.ව්‍යාපාරයක ශක්තීන් ,දුර්වලතා , අවස්ථා , තර්ජන 4 බැගින් සඳහන් කරන්න.

III.පහත සඳහන් මුදල් වර්ග භාවිතා වන රටවල් නම් කරන්න.

ඩොලරය පවුම යූරෝ

04.ආර්ථික පරිසරයට අයත් සාධක 3ක් දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න.

I.උද්ධමනය නැමැති සාධකය ව්‍යාපාර කොරහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

05.තාක්ෂණික පරිසරයේ වෙනස්වීම නිසා බිහි වී ඇති ව්‍යාපාර අවස්ථා 5ක් ලියන්න.

I.පාසල් අධ්‍යාපනය තුළ විද්‍යුත් තාක්ෂණික දැනුම ලබා දීම රටක සංවර්ධනයට ඉවහල් වන්නේ කෙසේද?

.............................................................. ........

කොවිඩ් 19 කාලසීමාව තුල ක්‍රියාත්මක වන කඩිනම් ඉගෙනුම් වැඩසටහන .

විෂයය:- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය ශ්‍රේණිය:- 10 පාඩම් ඒකකය :- ව්‍යාපාර සංවිධාන ගුරුවරයාගේ නම:- ජී.පී එච් විජිතා පාසල:- අම්/මොරගහපල්ලම විද්‍යාලය

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ව්‍යාපාර යනුවෙන් අදහස් කරන්නේ
(1) ඍජු හා වක්‍ර නිෂ්පාදනයයි. (2) භාණ්ඩ නිෂ්පාදනය කිරීමයි. (3) නිෂ්පාදන බෙදාහැරීමේ ක්‍රියාවලියකි. (4) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරනු ලබන ඕනෑම කටයුතු සමුදායකි.

02. හවුල් ව්‍යාපාර හා තනි පුද්ගල ව්‍යාපාරවල දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ
(1) නෛතික පුද්ගලභාවයක් තිබීම. (2) අඛණ්ඩ පැවැත්මක් නොතිබීම.
(3) වගකීම් අසීමිත වීම. (4) ලාභය අරමුණු කරගෙන යෑම.

03. සමුපකාර ලියාපදිංචි කළ යුත්තේ.
(1) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේය. (2) 1948 අංක 07 දරන සමාගම් පනත යටතේය. (3) 2007 අංක 02 දරණ සමාගම් පනත යටතේය. (4) 1972 අංක 05 දරන පනත යටතේය

04. රාජ්‍ය සංස්ථාවක විශේෂ ලක්ෂණය වන්නේ.
(1) පූර්ණ අයිතිය හෝ වැඩි කොටසක් රජය සතු වීමයි. (2) සම්පූර්ණයෙන් පෞද්ගලික අංශය සතුවීමයි. (3) සම්පූර්ණ අයිතිය කොටස් හිමියන් සතුවීමයි. (4) තනි පුද්ගලයෙකු සතුවීමයි.

05. හවුල් ව්‍යාපාරයක් ලිඛිත ගිවිසුමකින් තොරව පවත්වාගෙන යෑමේදී යම් අවස්ථාවක ආරවුලක් පැන නැගුණහොත් එහිදී ක්‍රියා කළ යුත්තේ.
(1) 1918 ව්‍යාපාර නාම ආඥා පනතට අනුවයි. (2) 2007 අංක 07 දරන සමාගම් පනත අනුවය.

(3) 1982 අංක 17 දරන සමාගම් පනත අනුව. (4) 1890 හවුල් ආඥා පනතට අනුව.

06. පූර්ණ අයිතිය රජය සතුවන ව්‍යාපාර සංවිධානය වන්නේ.
(1) රාජ්‍ය සංස්ථා (2) රාජ්‍ය සමාගම් (3) සමිති සංවිධාන (4) රාජ්‍ය දෙපාර්තමේන්තු

07. සංස්ථාපිත සමාගම් අනෙකුත් ව්‍යාපාර හා සැසඳීමේ දී සුවිශේෂ වේ. එම ලක්ෂණය වන්නේ
(1) පහසුවෙන් ආරම්භ කළ හැකි වීම. (2) අවශ්‍ය විටෙක වසා දැමිය හැකි වීම. (3)ලාභ බෙදාගතහැකි වීම. (4) විශාල ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම.

08. හිමිකාරිත්වය අනුව සමිති සංවිධාන අයත් වන්නේ.
(1) පෞද්ගලික අංශයේ ලාභය අරමුණු කර ගත් ව්‍යාපාර
(2) පෞද්ගලික අංශයේ ලාභය අරමුණු කර නොගත් ව්‍යාපාර
(3) රාජ්‍ය අංශයේ ලාභය අරමුණු කර ගත් ව්‍යාපාර
(4) රාජ්‍ය අංශයේ ලාභය අරමුණු කර නොගත් ව්‍යාපාර

09. 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව සීමිත සමාගමක් ආරම්භ කිරීමට අවශ්‍ය අවම සංඛ්‍යාව
(1) 1කි. (2) 2කි. (3) 20කි (4) 5කි.

10. ව්‍යාපාර සංවිධාන අරමුණු අනුව වර්ග කිරීමේ මූලික පදනම් දෙක වන්නේ,

(1) සුළු පරිමාණ,මහා පරිමාණ

(2) ලාභ අරමුණු කරගත් ව්‍යාපාර, සමාජීය සුභසාධනය අරමුණු කරගත් ව්‍යාපාර

(3) රජයේ ව්‍යාපාර හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර

(4) දේශීය ව්‍යාපාර හා විදේශීය ව්‍යාපාර

II කොටස

01.කේවලස්වාමි ව්‍යාපාර , හවුල් ව්‍යාපාර , සීමිත සමාගම් යන සංවිධාන ක්‍රම

I. අයිතිය , වගකීම , නීතිමය පුද්ගලභාවය, ලියාපදිංචිය. ප්‍රාග්ධන සම්පාදනය යන ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කර සැසඳීමක් කරන්න.

II.නීතිමය පුද්ගලභාවය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

III.පුද්ගලයකුට තනි ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ වාසි 4ක් ලියන්න.

02.පහත සඳහන් ව්‍යාපාර වල විධි විධාන දැක්වෙන පනත් මොනවාද?

සංස්ථාපිත සමාගම් , හවුල් ව්‍යාපාර, සමුපකාර

I. ඉහත ඔබ දැක් වූ ව්‍යාපාර සඳහා නිදසුන් 2 බැගින් ලියන්න.

03. පහත සඳහන් ව්‍යාපාර පාලනය කරන ආකාරය දක්වන්න.

I. තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, සමුපකාර, සමිති සමාගම්

II. කොවිඩ් - 19 තත්වය යටතේ සමුපකාර ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ කොතරම් වැදගත් වූයේ දැයි පැහැදිළි කරන්න.

04. තනි පුද්ගල ව්‍යාපාරයක හා හවුල් ව්‍යාපාරයක වාසි, අවාසි දෙක බැගින් ලියන්න.

I. පරිමාණය මත ව්‍යාපාර වර්ග කරන්නේ කෙසේද?

II.රාජ්‍ය සංස්ථා වල වාසි දෙකක් සඳහන් කරන්න.

III. රාජයේ දෙපාර්තමේන්තු තුනක් ලියන්න.

05. ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන මොනවාද?

I.තනි ව්‍යාපාරයකට ප්‍රාග්ධනය සම්පාදනය කරගත හැකි ක්‍රම 04 ක් ලියන්න.

II. හිමිකාරිත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කරන්නේ කෙසේද?

III. ව්‍යාපාරයක් ස්ථානගත කිරීමේදී සලකා බලන සාධක 04 ක් ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| විෂය | - | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 10 ශ්‍රේණිය | | |
| පාඩම | - | ගිණුම්කරණය හැඳින්වීම | | |
| ගුරුවරයාගේ නම | - | එස්.ඒ. මල්ලිකා | - | අම්/ බණ්ඩාරනායක බා. ජා. පා. |

I - කොටස

01. ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශව වල තීරණ ගැනීමට ප්‍රයෝජනවත් තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය,

I. ව්‍යාපාර වේ. II. වාණිජ්‍යය වේ.

III. ගිනුම්කරණය වේ. IV. ආර්ථිකය වේ.

02. ව්‍යාපාරයක වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම්, වියදම් ජනිත වන්නේ,

I. වෙළඳාම නිසා II. ව්‍යාපාර නිසා

III. ගනුදෙනු නිසා IV. විකිණීම නිසා

03. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අනාගතයේදී ආර්ථික ප්‍රතිඵල ගලා එන සම්පත් වන්නේ,

I. වගකීම් II. ආදායම්

III. වත්කම් IV. හිමිකම්

04.ව්‍යාපාරයක ආදායම හා වියදම අතර වෙනස,

I. වත්කම් වේ. II. හිමිකම් වේ.

III. වගකීම්වේ. IV. ලාභය වේ.

05. ව්‍යාපාරයකට යෙදවූ මුදල් හෝ භාණ්ඩ අයිතිකරුවා නැවත තම ප්‍රයෝජනයට ගන්නා විට ඒවා හඳුන්වන්නේ,

I. ගැනුම් ලෙසය. II. වත්කම් ලෙසය.

III. ගැනිලි ලෙසය. IV. සම්පත් ලෙසය.

06. ව්‍යාපාරයක විකුණුම් , පොලී ලැබීම්,කුලී ලැබීම් අයත් වන්නේ,

I. වත්කම් වලටය. II. වලකීම් වලටය.

III.ආදායම් වලටය. IV. වියදම් වලටය.

07. විකිණීම සඳහා භාණ්ඩ ණයට ගැනීමේදී බිහිවන ණය හිමියන් ගෙවිය යුතු විදුලි වියදම් අයත් වන්නේ,

I. ජංගම වත්කම් වලටය. II. ජංගම වගකීම් වලටය.

III.ජංගම නොවන වත්කම් වලටය. IV. ජංගම නොවන වගකීම් වලටය.

08. ගනුදෙණුවක් බේරුම් කිරීමේදී ව්‍යාපාරයේ සම්පත් වලින් කොටසක් පිටතට ගලායන්නේ,

I. වත්කමක දී II. වගකීමක දී

III. ආදායමේ දී IV. හිමිකමේ දී

09. ගිණුම්කරනයේ ප්‍රධානතම අරමුණ වන්නේ විවිධ පාර්ශවයන්ට,

I. තොරතුරු සැපයීම. II. ලාභ අලාභ පෙන්වීම.

III. නීතිමය අවශ්‍යතා සපුරාලීම. IV. වාර්ථා සෑදීම.

10. ව්‍යාපාරයක් වෙනත් පාර්ශවයක් අතර සම්පත් හුවමාරු වීම හඳුන්වන්නේ,

I. වෙළඳාමක් ලෙසය. II. විකිණීමක් ලෙසය.

III. ගණුදෙනුවක් ලෙසය. IV. පැවරීමක් ලෙසය.

## II - කොටස

01.ගිනුම්කරණය යන්න කෙටියෙන් හඳුන්වා එහි ප්‍රධානතම අරමුණ ලියන්න.

I. ව්‍යාපාරයක සිදුවිය හැකි ගනුදෙණු 05 ක් හා සිද්ධි 02 ක් ලියන්න.

02. ව්‍යාපාරයක ඇල්මැති පාර්ශව වෙත සපයන මූල්‍ය ප්‍රකාශන වලින් හඳුනාගත හැකි කරුණු මොනවාද?

I. ගිනුම්කරණ තොරතුරු නිවැරදි වීම මත ව්‍යාපාරයක් අත්පත් කර ගන්නා ප්‍රථිඵල 03 ක් ලියන්න.

II. කුඩා ව්‍යාපාර වලට ගිනුම්කරණ තොරතුරු වාර්ථා කිරීම වැදගත් නොවේ. මේ ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් ලියන්න.

03. ව්‍යාපාරයක සිදුවන ගණුදෙනු තුළින් බිහිවන ප්‍රථිඵල මොනවාද?

I. ව්‍යාපාරයක ගණුදෙනු වල ප්‍රථිඵල ලෙස ජනිත වන වත්කම්, හිමිකම්, වගකීම්, ආදායම් වියදම් සඳහා නිදසුන් 02 බැගින් ලියන්න.

II. ව්‍යාපාරයක සිදුවිය හැකි පහත සඳහන් ගණුදෙනු එම ව්‍යාපාරයට ඇතිකරන බලපෑම ලියන්න.

a.බැංකු ණයක් ලබා ගැනීම. b.විදුලි වියදම් ගෙවීම.

c.භාණ්ඩ විකිණීම. d.රක්ෂණ වන්දි ලැබීම.

04. වත්කමක් නිර්වචනය කර එහි ප්‍රධාන කොටස් කෙටියෙන් පැහැදිලි කරන්න.

I. වත්කමක දැකිය හැකි ලක්ෂණ 03 ක් ලියන්න.

II. ව්‍යාපාරයක කුළියට ගත් ගොඩනැගිල්ලක් ව්‍යාපාරයේ වත්කමක් ලෙස සැලකිය නොහැක්කේ ඇයි?

05. වගකීම් බෙදිය හැකි ප්‍රධාන කොටස් නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න.

I. ව්‍යාපාරයක ලාභය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

II. ගැනිලි යනු කුමක්දැයි හඳුන්වා ගැනිලි නිසා ව්‍යාපාරයට ඇතිකරන බලපෑම ලියා දක්වන්න.

III. ගිනුම්කරණ සමීකරණය යන්න පැහැදිලි කරන්න.

| | |
|---|---|
| විෂයය | :- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය      ශ්‍රේණිය:- 10 ශ්‍රේණිය |
| පාඩම්/ඒකකය | :- ගිණුම්කරණ සමීකරණ |
| ගුරුවරයාගේ නම | :- එම්.ජී.දීපිකා දිල්රුක්ෂි |
| පාසල | :- අම් / මඩවලලන්ද මහා විද්‍යාලය |

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

## I කොටස

01) ව්‍යාපාරයකට අයත් සම්පත් සියල්ල අයිතිකරු විසින් සපයා ඇති විට ගිණුම්කරණ සමීකරණය,

I වත්කම් = හිමිකම් + වගකීම්

II වත්කම් = අදායම් + වියදම්

III වත්කම් = වගකීම්

IV වත්කම් = හිමිකම් + වගකීම්

02) අයිතිකරුගේ හිමිකම වෙනස් වීමට බලපාන ගනුදෙනුවක් නොවන්නේ,

I අමතර ප්‍රාග්ධනය යෙදවීම

II වියදම් ගෙවීම්

III අදායම් ලැබීම්

IV බැංකු ණය ගැනීම

03) රු: 15 000ක භාණ්ඩ තොගයක් රු: 20 000 කට විකිණීම ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය වන්නේ,

| | වත්කම් = හිමිකම් + වගකීම් | | |
|---|---|---|---|
| I. | - 15 000<br>+ 20 000 | - 15 000 | |
| II. | + 20 000 | - 15 000 | - 5 000 |
| III. | - 15 000 | + 20 000 | + 5 000 |
| IV. | - 20 000<br>+ 15 000 | | - 5 000 |

04) රු: 12 000 ක මුදලක් අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය වන්නේ

| | වත්කම් = හිමිකම් + වගකීම් | | |
|---|---|---|---|
| I. | + 12 000 | - 12 000 | |
| II. | + 12 000 | | - 12 000 |
| III. | - 12 000 | - 12 000 | |
| IV. | - 12 000 | | + 12 000 |

05) 01/01 ප්‍රාග්ධනය රු: 50 000

01/15 ගැනිලි 10 000

01/21 වියදම් 5 000

මෙම ව්‍යාපාරයේ 12/31 දිනට හිමිකම කියද ?

I රු : 45 000

II රු : 65 000

III රු : 60 000

IV රු : 35 000

## II කොටස

01) ගිණුම්කරණ සමීකරණ යනු කුමක් ද?

02) රු: 50 000ක් වටිනා මෝටර් රථයක් හා රු: 300 000 ක බැංකු ණයක් ලබාගෙන ව්‍යාපාරයක් ආරම්භ කළේය. ඉහත ගණුදෙනුව ගිණුම්කරණ සමීකරණය තුල දක්වන්න.

03) පහත දැක්වෙන්නේ සමීර විදින් ආරම්භ කරන ලද "සමීර පොත් හල" හි 2021 ජනවාරි මස සිදු වූ ගනුදෙනු ය.

01/05 රු: 50 000 ක් මුදලින් ද රු: 100 000 ක් වටිනා ගොඩනැගිල්ලක් ද යොදවා ව්‍යාපාරය ආරම්භ කිරීම.
01/12 රු: 80 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
01/15 ව්‍යාපාර කටයතු සඳහා රු: 30 000 ක උපකරණ මිලදී ගැනීම.
01/17 ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ සේවක වැටුප ලෙස රු: 5 000ක් ගෙවීම.
01/28 විදුලි බිල රු: 1 500ක් ගෙවීම.

අවශ්‍යා වන්නේ

I. ඉහත ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය වටිනාකම් සහිතව දක්වන්න.

04) අමිලගේ ව්‍යාපාරයේ 2021 අප්‍රේල් මස සිදු වූ ගනුදෙනු ගිණුම් සමීකරණයට බලපාන ආකාරය පහත දැක්වේ.

| | වත්කම් (රු)= | | | | හිමිකම් + වගකීම් (රු) | | |
|---|---|---|---|---|---|---|---|
| | ඉඩම් හා ගොඩනැගිලි + | ණය ගැතියෝ + | භාණ්ඩ තොගය + | මුදල් = | හිමිකම + | බැංකු ණය + | ණය හිමියෝ + |
| ආරම්භක ශේෂය | 800 000 | 50 000 | 100 000 | 500 000 | 800 000 | 500 000 | 150 000 |
| 04/07 | | | -20 000 | + 30 000 | + 10 000 | | |
| 04/10 | | - 10 000 | | + 10 000 | | | |
| 04/20 | | | | - 5 000 | - 5 000 | | |
| 04/22 | | | | - 40 000 | | | - 40 000 |
| 04/27 | | | | - 9 000 | | - 9 000 | |

අප්‍රේල් මාසය තුල අමිල විසින් ගැනිලි සිදුකර නැත.

අවශ්‍යා වන්නේ :-

I.එක් එක් දිනයේ සිදු වූ ගනුදෙනු වටිනාකම් සහිතව දැක්වීම.

05) ව්‍යාපාර අයිතීන්ගේ හිමිකම වෙනස් වීමට බලපාන ගනුදෙනු මොනාව ද?

06) "සඳලි එනටප්‍රයිසස්" හි 2020 වර්ෂය සඳහා තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

2020/01/01 දිනට ප්‍රාග්ධනය රු: 1 000 000
වර්ෂය තුල අදායම රු: 750 000
වර්ෂය තුල වියදම රු: 350 000
අයිතිකරු යෙදවූ මුදල් රු: 120 000
අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගත් මුදල රු: 50 000

අවශ්‍යා වන්නේ

I. 2020/12/31 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කිරීම.

| | |
|---|---|
| විෂයය | :- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය ශ්‍රේණිය:- 10 ශ්‍රේණිය |
| පාඩම/ඒකකය | :- ගනුදෙනුවල ද්විත්ව බලපෑම |
| ගුරුවරයාගේ නම | :- එම්.ජී.දීපිකා දිල්රුක්ෂි |
| පාසල | :- අම් / මඩවලලන්ද මහා විද්‍යාලය |

සියලුම ප්‍රදේශවලට පිළිතුරු සපයන්න.

I කොටස

01. ගනුදෙනුවක ද්විත්ව බලපෑම යනු
   I. සෑම ගනුදෙනුවක්ම ගිණුම්කරණ සමීකරණයේ අයිතම දෙකකට බලපාන බව
   II. සෑම ගනුදෙනුවක්ම ව්‍යාපාරයේ වත්කම් වලට පමණක් බලපාන බව
   III. සෑම ගනුදෙනුවක්ම ව්‍යාපාර වගකීම් වලට බලපාන බව
   IV. සෑම ව්‍යාපාරයකම ගනුදෙනු දෙකක් පමණක් සිදුවන බව

02. ගෙවිය යුතු විදුලි ගාස්තු ගිණුම,
   I. වත්කම් ගිණුමකි.
   II. වගකීම් ගිණුමකි.
   III. ආදායම් ගිණුමකි.
   IV. වියදම් ගිණුමකි.

03. ගැනිලි ගිණුම,
   I. ආදායම් ගිණුමකි.
   II. වියදම් ගිණුමකි.
   III. හිමිකම් ගිණුමකි.
   IV. වගකීම් ගිණුමකි.

04. ලෙජරය යනු,
   I. ව්‍යාපාරයක ඇති වත්කම් ගිණුම් ය.
   II. ව්‍යාපාරයක ඇති වගකීම් ගිණුම් ය.
   III. ව්‍යාපාරයක ඇති හිමිකම් ගිණුම් ය..
   IV. ව්‍යාපාරයක ඇති වත්කම්,වගකීම්,හිමිකම්,ආදායම්,වියදම් යන සියල්ලේ එකතුවයි.

05. රු: 5 000ක බැංකු ණය වාරිකය ගෙවීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,
   I. බැංකු ණය හර 5 000
      මුදල් බැර 5 000
   II. මුදල්හර5 000
      බැංකු ණය බැර 5 000
   III. මුදල් හර 5 000
      බැංකු බැර 5 000
   IV. ණය පොලී හර 5 000
      මුදල් හර 5 000

06. මුදල් හර 20 000 ප්‍රාග්ධනය බැර 20 000 යන ද්විත්ව සටහනට අදාළ ගනුදෙනුව වන්නේ,
   I. අයිතිකරු රු: 20 000 ගැනිලි සිදු කිරීම.
   II. අයිතිකරු අමතර ප්‍රාග්ධන ලෙස රු: 20 000ක් යෙදවීම.
   III. රු: 20 000 ක බැංකු ණයක් ගැනීම.
   IV. රු: 20 000 ක යන්ත්‍රයක් මිලදී ගැනීම.

II. කොටස

02.ගිණුමක් යන්න හඳුන්වා ගිණුමක ආකෘතිය ඇඳ දක්වන්න.
03.ව්‍යාපාරයක ඇති ගිණුම් ප්‍රධාන ශීර්ෂ 05ක් යටතේ වර්ග කල හැකිය.එම ගිණුම් වර්ග 05ක් දක්වන්න.
04. පහත ගිණුම් කුමන වර්ගයට අයත්දැයි දක්වන්න.

I.මුදල් ගිණුම IV. ණයහිමි ගිණුම
II. විදුලි බිල ගිණුම V. බැංකු ණය ගිණුම
III. ණයගැති ගිණුම VI. විකුණුම් ගිණුම

05. ද්විත්ව සටහන් මූලධර්මය අනුව පහත ගිණුම්වල අඩු වැඩි වීම් සටහන් කරනුයේ හර පැත්තේ ද බැර පැත්තේ ද යන්න දක්වන්න.

| ගිණුම | වැඩිවීම | අඩුවීම |
|---|---|---|
| ඉඩම් ගිණුම | | |
| ප්‍රාග්ධන ගිණුම | | |
| ගැනුම් ගිණුම | | |
| විකුණුම් ගිණුම | | |
| සේවක වේතන ගිණුම | | |
| ලැබූ පොලී ගිණුම | | |
| ලැබූ කොමිස් ගිණුම | | |
| යන්ත්‍ර හා උපකරණ ගිණුම | | |
| දුරකථන ගාස්තු ගිණුම | | |
| ණයහිමි ගිණුම | | |

06. පහත දැක්වෙන්නේ පුබුදුගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයට අදාළ ගනුදෙනු කිහිපයකි.

01/01 පුබුදු රු: 100 000 ක මුදලක් ප්‍රාග්ධනය ලෙස යෙදවීම.
01/06 රු: 500 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
01/09 රු: 75 000 ක් වටිනා උපකරණයක් මිලදී ගැනීම.
01/12 රු: 40 000ක් වටිනා භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීම.
01/16 රු: 10 000 ක භාණ්ඩ ණයට විකිණීම.
01/20 රු: 5 000 ක බැංකු ණය වාරිකය ගෙවීම.
01/21 රු: 35 000 ක සේවක වේතන ගෙවීම.
01/23 රු: 15 000 ක් වටිනා භාණ්ඩ අත්පිට මුදලට විකිණීම.
01/25 පොලී ආදායම් ලැබීම රු: 12 000.
01/28 ණය ගැතියන්ගෙන් රු: 4 000ක මුදලක් ලැබීම.

අවශ්‍ය වන්නේ
I. ඉහත ගනුදෙණු වලට අදාලව ද්විත්ව සටහන් ලියන්න.
II. ඉහත ගනුදෙනු ගිණුම්ගත කරන්න.
III.පහත සංකල්ප පැහැදිලි කරන්න.

a.හිමිකම c.ණය ගැතියෝ
b.ප්‍රාග්ධනය d.ගිණුම

**විෂය - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**
**ශ්‍රේණිය - 10**
**පාඩම/ ඒකකය - මූලික සටහන් පොත්**
**ගුරුවරයා ගේ නම - අජන්තා උස්වත්ත**
**පාසල - ඩී එස් සේනානායක ජාතික පාසල අම්පාර**

<u>සටහන</u>

ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ මූලාශ්‍ර ලේඛන පදනම් කරගෙන මුලින්ම සකස් කරනුයේ මූලික සටහන් පොත් ය.

<u>ගිණුම්කරණ ක්‍රියාවලිය</u>

මූලාශ්‍ර ලේඛන → මූලික සටහන් පොත් → ලෙජර් ගිණුම් → ශේෂ පිරික්සුම → මූල්‍ය ප්‍රකාශන

මූලික සටහන් පොත්

1. මුදල් පොත
2. බැංකු ගිණුම
3. සුළු මුදල් පොත
4. ගැනුම් ජනලය
5. පොදු ජනලය

- අදාළ මූලාශ්‍ර ලේඛන

1. ලදු පත හාව අවසරය
2. තැන්පත් කිරීමේ කුවිතාන්සිය, ගෙවීම් වව්චරය, අගරු චෙක්පත් දැනුම් දීමේ ලිපිය, බැංකු ප්‍රකාශන
3. සුළු මුදල් ගෙවීමේ බවුසරය
4. ගැනුම් ඉන්වොයිසිය
5. ජනල් වවුචරය

**අංක 01 සිට 10 දක්වා වූ ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

01. ගිණුම්කරණ ක්‍රියාවලිය ලෙජර් ගිණුම් සටහන් කිරීමට පෙර සකස් කරනු ලබන්නේ,
1. මූලික සටහන් පොත් 2. වත්කම් ගිණුම් 3. මූල්‍ය ප්‍රකාශන 4. ශේෂ පිරික්සුම

02. මූලික සටහන් පොත් හඳුන්වනු ලබන වෙනත් නමක් නොවන්නේ,
1. උපයෝගී පොත් 2. දෛනික පොත් 3. ජ' නල 4. පොදු ජනලය

03. මූලික සටහන් පොත් පිළියෙල කිරීමේදී අදාළ තොරතුරු ලබා ගන්නා ලියවිල්ල වන්නේ,
1. මුදල් පොත 2. මූලාශ්‍ර ලේඛන 3. බැංකු ගිණුම 4. සුළු මුදල් පොත

04. පහත සඳහන් ගණුදෙනු හා එයට අදාළ මූලික සටහන් පොත් වල ගැළපූ විට නිවැරදි පිළිතුර

| <u>ගණුදෙනු වගර්ය</u> | <u>මූලික සටහන් පොත</u> |
|---|---|
| 1. මුදල් ලැබීම් හා ගෙවීම් සම්බන්ධ ගනුදෙනු | A බැංකු ගිණුම |
| 2. බැංකු ජංගම ගිණුම් සම්බන්ධ ගනුදෙනු | B විකුනුම් ජනර්ලය |
| 3. වෙළඳ භාණ්ඩ ණයට ගැනීම සම්බන්ධ ගනුදෙනු | C ගැනුම් ජනලය |
| 4.වෙළඳ භාණ්ඩ ණයට විකිණීම සම්බන්ධ ගනුදෙනු | D මුදල් පොත |

වන්නේ,

1. A B C D 2. D A C B 3. D A B C 4. A D C B

05. මුදල් පොත පිළියෙල කිරීමේදී අදාල කරගන්නා මූලාශ්‍ර ලේඛන වන්නේ,

1. ගැනුම් හා විකුණුම් ඉන්වොයිසිය
2. ලදු පත හා වවුචරය
3. ලදු පත හා ජනල වවුචර
4. වවුචර හා ගැනුම් ඉන්වොයිසිය

06. බැංකු ගිණුම පිළියෙල කිරීමේ දී අදාළ නොවන මූලාශ්‍ර ලේඛනයක් වන්නේ,

1.තැන්පත් කිරීමේ කුවිතාන්සිය
2.බැංකු ප්‍රකාශන
3.අගරු චෙක්පත් දැනුම්දීමේ නිවේදන
4.ගැනුම් ඉන්වොයිසිය

07. ව්‍යාපාරයක මූලික සටහන් පොත් හා මූලාශ්‍ර ලේඛන පිළිවෙළින් ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛනය |
|---|---|
| 1. සුළු මුදල් පොත | A ජනර්ල් වවුචරය |
| 2. ගැනුම් ජනලය | B විකුණුම් ඉන්වොයිසිය |
| 3. විකුණුම් ජනලය | C සුළු මුදල් ගෙවීමේ වවුචරය |
| 4. පොදු ජනලය | D ගැනුම් ඉන්වොයිසිය |

1. C D B A    2. C A D B    3. C D A B    4. B D A C

08. අනෙකුත් උපයෝගී පොත් වල සටහන් නොවන වෙනත් ගනුදෙනු සටහන් කිරීමට භාවිත කරන උපයෝගී පොත,

1. මුදල් පොත   2. ගැනුම් ජනලය   3. සුළු මුදල් පොත   4. පොදු ජනලය

**අංක 9 සහ 10 සඳහා පිළිතුරු සැපයීමේදී පහත තොරතුරු භාවිතා කරන්න.**

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය |
|---|---|
| 1. රු 5 000 ක වැටුප් ගෙවීම. | A විකුණුම් ඉන්වොයිසිය |
| 2. රු 4 000 ක භාණ්ඩ ණයට ගැනීම. | B ලදු පත |
| 3. රු 8 000 ක භාණ්ඩ ණයට විකිණීම. | C ගෙවීම් වවුචරය |
| **4.** රු 2 000 ක කොමිස් ආදායමක් ලැබීම. | D ගැනුම් ඉන්වොයිසිය |

09. ඉහත ගනුදෙනු අනුපිළිවෙලට මූලාශ්‍ර ලේඛන වලට ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

1. C D B A    2. C D A B    3. C A D B    4. B D A C

10. ඉහත ගනුදෙනු සටහන් කිරීමේ කිරීමේදී අදාළ වන මූලික සටහන් පොත් පිළිවෙළින් වන්නේ,

1. මුදල් පොත, ගැනුම් ජනර්ලය, විකුණුම් ජනලය, මුදල් පොත
2. මුදල් පොත, ගැනුම් ජනලය, පොදු ජනර්ලය, විකුණුම් ජනලය
3. මුදල් පොත, පොදු ජනර්ලය, ගැනුම් ජනලය, මුදල් පොත
4. මුදල් පොත, ගැනුම් ජනලය, විකුණුම් ජනලය, මුදල් පොත

**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

1. උපයෝගී පොත් යන්න කෙටියෙන් හඳුන්වා ඒවා නම් කරන්න.
2. උපයෝගී පොත් වල අවශ්‍යතාවය කරුණු වශයෙන් ලියා දක්වන්න.
3. මූලාශ්‍ර ලේඛන යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? ඒවා නම් කරන්න.
4. මූලාශ්‍ර ලේඛන වල අඩංගු විය යුතු කරුණු ලියා දක්වන්න.
5. මූලාශ්‍ර ලේඛන වල ප්‍රයෝජන ලියා දක්වන්න.

| | |
|---|---|
| පාඩම්/ඒකකය -: මුදල්පොත හා සුළු මුදල්පොත | විෂය -: ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය 10 ශ්‍රේණිය |
| ගුරුවරයාගේ නම -: D.G.R.රත්නසිලි | පාසල -: කලාප අධ්‍යාපන කාර්යාලය. |

❖ සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01) මුදල් පොත සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

I. මුදල් සම්බන්ධ ගණුදෙනු සටහන් තබන ලේඛනයයි.
II. මුදල් ලැබීම් හා ගෙවීම් සටහන් තබන මූලික සටහන් පොතයි.
III. ව්‍යාපාරයක වැදගත්ම මූලික ලියවිල්ලයි.
IV. ව්‍යාපාරයකට විවිධාකාරයෙන් ලැබෙන මුදල් පිළිබඳ සටහන් තබන ලේඛනයයි.

02) ව්‍යාපාරයකට යම් මුදලක් ලැබුණු බව සනාථ කරමින් මුදල් ගෙවූ පාර්ශවය වෙත නිකුත් කරන කුවිතාන්සිය වන්නේ,

I. ගැනුම් ජර්නලයයි.
II. චෙක්පතයි.
III. වවුචරයයි.
IV. ලදුපතයි.

03) මුදල් පොතක් ද්විත්ව කාර්යයක් ඉටු කරයි.එම කාර්යයන් දෙක නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

I. මුදල් වැඩි වීම හා අඩු වීම පෙන්නුම් කරයි.
II. ව්‍යාපාරයේ මුදල් ශේෂය හා අතැති මුදල් ශේෂය පෙන්නුම් කරයි.
III. මූලික සටහන් පොතක් හා ලෙජර ගිණුමක් ලෙස කටයුතු කරයි.
IV. මූලික සටහන් පොතක් හා ලැබීම් සනාථ කරන ලේඛනයක් ලෙස කටයුතු කරයි.

04) මුදල් පොතේ ශේෂය නිතරම,

I. හර ශේෂයක් විය යුතුය.
II. හර හෝ බැර ශේෂයක් විය යුතුය.
III. ශේෂයක් නොමැතිව තුලනය විය යුතුය.
IV. බැර ශේෂයක් විය යුතුය.

05) ගණුදෙනුවක් මත ඇති වන වට්ටම් ප්‍රධාන ආකාර වන්නේ,

I. වෙළඳ වට්ටම්.
II. මුදල් වට්ටම්.
III. වෙළඳ වට්ටම් හා මුදල් වට්ටම්.
IV. දුන් වට්ටම් හා ලද වට්ටම්.

06) දුන් වට්ටම් වලට අදාළ ද්විත්ව සටහන නිවැරදිව දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

I. දුන් වට්ටම් ගිණුම හර - ණයගැති ගිණුම බැර
II. ණයගැති ගිණුම හර - දුන් වට්ටම් ගිණුම බැර
III. දුන් වට්ටම් ගිණුම හර - මුදල් පොත බැර
IV. දුන් වට්ටම් ගිණුම හර - වට්ටම් ගිණුම බැර

07) සුළු මුදල් පොත සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

I. ව්‍යාපාරයක නිතර සිදුවන සුළු වටිනාකම් සහිත ලැබීම් ගෙවීම් සටහන් තබන මූලික පොතවේ.
II. තැපැල් ගාස්තු,ගමන් වියදම්,සංග්‍රහ වියදම්,ලිපිද්‍රව්‍ය වියදම් සටහන් තබන ලේඛනයයි.
III. මුදල් පොතේ සටහන් නොකරන ගණුදෙනු සටහන් තබන ලේඛනය වේ.
IV. ව්‍යාපාරයක සිදුවන අඩු වටිනාකමකින් යුතු නිතර කරන ගෙවීම් පිළිබඳ සටහන් තබන මූලික පොතවේ.

08) සිරිමල්ගේ ව්‍යාපාරයේ රු.15000 ක් වටිනා බඩු තොගයක් නිමල්ට ණයට විකිණීමට අදාළ ද්විත්ව සටහන විය යුත්තේ,

I. නිමල්ගේ ගිණුම හර රු.15000 - විකුණුම් ගිණුම බැර රු.15000
II. විකුණුම් ගිණුම හර රු.15000 - නිමල්ගේ ගිණුම බැර රු.15000
III. මුදල් ගිණුම හර රු.15000 - විකුණුම් ගිණුම බැර රු.15000
IV. මුදල් ගිණුම හර රු.15000 - නිමල්ගේ ගිණුම බැර රු.15000

09) ව්‍යාපාරයක වත්කම් හා වගකීම් වැඩි වීමට බලපාන ගණුදෙනුවක් වන්නේ,

I. රු.50000 ක බැංකු ණයක් ලබා ගැනීම.
II. රු.10000 ක භාණ්ඩ ණයට විකිණීම.
III. ණයහිමියන්ට රු.10000 ක් ගෙවීම.
IV. ණයගැතියෙකුගෙන් රු.1000 ක් ලැබීමය.

10) පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

I. සුළු මුදල් අග්‍රමය ක්‍රමයට අනුව සෑම මාසයක් අවසානයේම සමාන මුදලක් ප්‍රතිපූර්ණය කෙරේ.
II. දුන් වට්ටම් ආදායමක් වන අතර ලද වට්ටම් වියදමක් වේ.
III. මුදල් පොත මූලික සටහන් පොතක් මෙන්ම ලෙජර් ගිණුමක් ලෙසද කටයුතු කරයි.
IV. ලී බඩු උපකරණ ගිණුම වියදම් ගිණුමකි.

❖ **පහත සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.**

I. ගෙවීම් වවුචරය.
II. ගිණුම් තුලනය.
III. වෙළඳ වට්ටම, මුදල් වට්ටම, දුන් වට්ටම, ලද වට්ටම.
IV. සුළු මුදල් පොත, සුළු මුදල් අග්‍රිමය, සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම.

❖ **2021/01/01 ආරම්භ කළ රෙක්ස්ගේ ව්‍යාපාරයේ ජනවාරි මස සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.ඒවා අදාළ ලෙජර් ගිණුම් වල සටහන් කරන්න.**

I. 2020/01/01 රු.50 000 ක ප්‍රාග්ධනයක් යෙදවීම.
II. 2020/01/02 රු.25 000 ක් වටිනා වෙළඳ භාණ්ඩ මිලදී ගැනීම, රු.50 000 ක බැංකු ණයක් ලබා ගැනීම.

III. 2020 ජනවාරි මාසය සඳහා රු. 3000 ක් විදුලි ගාස්තු ගෙවීම.

IV. 2020.01.03 විකිණීම සඳහා රු. 50000 ක බඩු තොග මිලදී ගැනීම.

V. 2020.01.15 රු. 100000 ක බැංකු ණයක් ලබා ගැනීම.

෧෨

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## පාඩම/ඒකකය- බැංකු ගිණුම සහ බැංකු සැසඳුම් විස්තරය 10 ශ්‍රේණිය

ගුරුවරයාගේ නම- ඒ. වී. පී. ලසන්ත විජේසේකර පාසල- අම්/නාමල්තලාව මහා විදුහල

**වඩාත් නිවරෙදි පිළිතුර තෝරන්න**

01 බැංකු ගිණුමේ ගනුදෙනු සටහන් කිරීමට යොදාගන්න මූලාශ්‍ය ලේඛනයක් **නොවන්නේ**

1 පිලිපත 2 මුදල් තැන්පත් කිරීමේ පත්‍රිකා 3 අගරු නිවේදන 4 ජනල් වවුචර්

02 චෙක්පත් අගරු වීමට හේතුවක් **නොවන්නේ**

1 ගිණුමේ මුදල් නොමැති වීම 2 අනකරුගේ අත්සන වැරදි වීම

3 අනකරු මිය ගොස් සිටීම 4 චෙක්පත ලද වහාම බැංකුවේ තැන්පත් කිරීම

03 බැංකු අයිරාව පිළිබඳ නොගැලපෙන ප්‍රකාශය වන්නේ

1 බැංකු අයිරාවක් පවතින විට බැංකු ගිණුමේ බැර ශේෂයක් පවතී 2 බැංකු අයිරාව ජංගම වගකීමකි

3 බැංකු අයිරාව කෙටිකාලීන ණයකි 4 බැංකු අයිරාව ඕනෑම ගිණුම් හිමියෙකුට ලබාගත හැක

04 බැංකුව විසින් අයකරනු ලබන බැංකු ගාස්තු ව්‍යාපාරයේ සටහන් කරන්නේ

1 බැංකු ගිණුමේ හරට 2 බැංකු ගිණුමේ බැරට 3 මුදල් ගිණුමේ හරට 4 බැංකු ගාස්තු ගිණුමේ බැරට

රණ මයුර ව්‍යාපාරයේ 2010 ජූනි මාසය අවසාන දින වන විට බැංකු ගිණුමේ හේෂය රු 31000 විය. එම මාසයට අදාලව බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය මීට වෙනස් විය. වෙනසට හේතු පහත පරිදි වේ.

තැන්පත් කල නමුත් නිශ්කාෂනය නොවූ චෙක් පත් රු 14000කි ණය ගැති සෘජු පේෂණ රු 11000 කි

නිගුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් රු 16000 කි

බැංකුගිණුමේ සටහන්නොවූ ස්ථාවර නියෝග මත කල ගෙවීම් රු 18000 කි

බැංකුගිණුමේ සටහන්නොවූ බැංකුව අයකල බැංකු ගාස්තු රු 3000 කි

05 ඉහත තොරතුරු අනුව පිළියෙල කළ සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය වනුයේ

1 රු 30 000 2 රු 12 000 3 රු 21 000 4 රු 42 000

06 2021 ජූනි මාසයට අදාල බැංකු ප්‍රකාශනයේ සදහන් වූ ශේෂය වනුයේ

1 රු 23 000 2 රු 21 000 3 රු 16 000 4 රු 42 000

07 බැංකු ගිණුම සංශෝධනය කිරීම සඳහා සලකා නොබලන කරුණ වන්නේ

1 සෘජු ප්‍රේෂණ 2 බැංකු ගාස්තු 3 ස්ථාවර නියෝග 4 නිගුත්කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත්

08 බැංකු සැසඳුමක් පිළියෙල කිරීමට අවශ්‍ය ගනුදෙනු වන්නේ

1 සෘජු ප්‍රේෂණ , බැංකු ගාස්තු 2 තැන්පත් කල නමුත් නිශ්කාෂනය නොවූ චෙක්පත , බැංකු ගාස්තු

3 තැන්පත් කල නමුත් නිශ්කාෂනය නොවූ චෙක්පත , නිගුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත

4 සෘජු ප්‍රේෂණ, නිත්‍ය නියෝග මත ගෙවීම්

09 බැංකු අයිරාවක් ඇතිවන්නේ

1 බැංකු ගිණුමේ මුදල් ආපසු ගැනීමෙනි 2 චෙක්පත් අගරු වීමෙනි

3 බැංකුගිණුමේ ශේෂය ඉක්මවා නිගුත්කරන ලද චෙක්පත් වලට බැංකුව ගෙවීම් කිරීමෙනි

4 චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීම ඉක්මවා ගෙවීම් සඳහා චෙක්පත් නිගුත්කිරීමේනි

10 වාණිජ බැංකුවක් සෑම ජංගම ගිණුම් හිමියෙකුටම සෑම මසක් අවසානයේ දී එවනු ලබන්නේ

1 අගරු චෙක්පත් නිවේදනය 2 සංශෝධිත බැංකු ගිණුම් ප්‍රකාශනයයි 3 බැංකු ප්‍රකාශයයි 4 බැංකු සැසඳුමයි

**පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න**

01 පහත ගනුදෙනුවල ද්විත්ව සටහන් ලියන්න

- ලැබීතිබුන චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීම
- ණයගැතියන්ගෙන් ලැබී බැංකුවේ තැන්පත් කල චෙක්පත් අගරු වීම
- ණය හිමියන්ට නිගුත්කල චෙක්පත් අගරු වීම
- ගැනුම් සඳහා චෙක්පතක් නිගුත් කිරීම

02 බැංකු ගිණුමේ හා බැංකු ප්‍රකාශනයේ ශේෂ එකිනෙකට අසමාන වීමට හේතු දක්වන්න

03 2021 ජුනි මාසයේ කොලම්බස්ගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හර ශේෂය රු 10000කි එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය වෙනස් වේ වෙනසට හේතු මෙසේය

- ජුනි මාසයේ දී තැන්පත්කරන ලද නමුත් එම මාසය තුලදී නිෂ්කාෂනය නොවූ චෙක්පත්වල අගය රු 15000කි
- ජුනි මාසයේ ලියන ලද නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් රු12000
- බැංකු ගාස්තු රු1 500 හා ණයගැතියන්ගෙන් ලද සෘජුප්‍රේෂණ රු2000 බැංකු ගිණුමේ සටහනව නැත

බැංකු ගිණුමේ ගැලපීම් කොට 2021 06 30 දිනට සංශෝධිත බැංකු ශේෂය ගනනය කොට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න

04 බැංකුවේ අවාසිදායක ශේෂයක් යන්න පැහැදිලි කරන්න

05 අගරු චෙක්පත් නිවේදනය හා බැංකු ප්‍රකාශනය යන්න පැහැදිලි කරන්න

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

පාඩම/ඒකකය- ගැනුම් ජනලය, විකුණුම් ජනලය සහ පොදු ජනලය 10 ශ්‍රේණිය

ගුරුවරයාගේ නම- ඒ. වී. පී. ලසන්ත වීජේසේකර පාසල- අම්/නාමල්තලාව මහා විදුහල

01 ගැනුම් ජනලයේ සටහන්කරන ගනුදෙනු වන්නේ

1 ණයට ගැනුම් 2 වෙළද භාණ්ඩ ණයට ගැනුම් 3 සියළුම ණයට ගැනුම් 4 ජංගම නොවන වත්කම් ණයට ගැනුම්

02 ගැනුම් ජනලයේ ගනුදෙනු සටහන් කිරීමට යොදාගන්නා මුලාශ්‍ර ලේඛනය වන්නේ

1 ගැනුම් ඉන්වොයිසිය 2 විකුණුම් ඉන්වොයිසිය 3 ඉන්වොයිසිය 4 ජනල් වවුචරයයි

03 ගැනුම් ඉන්වොයිසියක සදහන් කොන්දේසිය වුයේ 8/30/ශුද්ධ 60 වේ. මින් අදහස් වන්නේ

1 ඉන්වොයිසියේ සදහන් මුදල දින 60 හෝ 30 තුල ගෙවිය යුතු බවයි

2 ඉන්වොයිසියේ සදහන් මුදල දින 60 තුල ගෙවිය යුතු බවත් දින 08 ඇතුලත ගෙවන්නේ නම් 30% ක මුදල් වට්ටමක් ලැබෙන බවයි

3 ඉන්වොයිසියේ සදහන් මුදල දින 60 තුල ගෙවිය යුතු බවත් දින 30 ඇතුලත ගෙවන්නේ නම් 08% ක මුදල් වට්ටමක් ලැබෙන බවයි

4 ඉන්වොයිසියේ සදහන් මුදල දින 60 තුල ගෙවිය යුතු බවයි

04 කාලච්ඡේදයක් අවසානයේ ගැනුම් ජනලයේ එකතුව

1 ගැනුම් ගිණුමට හර කරයි 2 ගැනුම් ගිණුමට බැර කරයි

3 ණයට ගැනුම් ගිණුමට හර කරයි 4 ඉහත කිසිවක් නොවේ

05 විකුණුම් ජනලයේ සටහන්කරන ගනුදෙනු වන්නේ

1 ණයට විකුණුම් 2 වෙළද භාණ්ඩ ණයට විකුණුම් 3 සියළුම ණයට විකුණුම් 4 ජංගම නොවන වත්කම් ණයට විකුණුම්

06 විකුණුම් ජනලයේ ගනුදෙනු සටහන් කිරීමට යොදාගන්නා මූලාශ්‍ර ලේඛනය වන්නේ

1 ලදුපත 2 විකුණුම් ඉන්වොයිසිය 3 ඉන්වොයිසිය 4 වවුචරය

07 කාලච්ඡේදයක් අවසානයේ විකුණුම් ජනලයේ එකතුව

1 විකුණුම් ගිණුමට හර කරයි 2 විකුණුම් ගිණුමට බැර කරයි

3 ණයට විකුණුම් ගිණුමට හර කරයි 4 ඉහත කිසිවක් නොවේ

08 පොදු ජනලයේ ගනුදෙනු සටහන් කිරීමට යොදාගන්නා මූලාශ්‍ර ලේඛනය වන්නේ

1 ගැනුම් ඉන්වොයිසිය 2 විකුණුම් ඉන්වොයිසිය 3 සුළු මුදල් වවුචරය 4 ජනල් වවුචරයයි

09 පොදු ජනලයේ සටහන් කරන සෑම ගනුදෙනුවකට අදාලව තබන කෙටි සටහන හදුන්වන්නේ

1 කෙටි සටහන ලෙස 2 පනල් සටහන ලෙස 3 ගනුදෙනු සාරාංශය ලෙස 4 සංලක්ෂය ලෙස

10 පරිගණක ගත ගිණුම්කරණය සදහා යොදා ගන්නා පරිගණක මෘදුකාංග වන්නේ

1 Acc pac 2 Quick book 3 MYOB 4 ඉහත සියල්ලම

පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න

01 ගැනුම් ජනලය යන්න පැහැදිලි කරන්න

02 විකුණුම් ජනලය යන්න පැහැදිලි කරන්න

03 දුරකථන බැංකු සේවා මගින් ගනුදෙනු කරුවන්ට ලැබෙන වාසි අවාසි දක්වන්න

04 පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ වාසි අවාසි දක්වන්න

05 වර්තමානයේ තාක්ෂණය භාවිතාකරමින් සිදුකරන ව්‍යාපාර කටයුතු දක්වන්න

- වත්මන් කොවිඩ් 19 තත්වය මත අන්තර්ජාල භාවිතාකර ඔබේ නිවසේ සිදුකරන ගනුදෙනු 03 ක් ලියන්න.

පාඩම්/ඒකකය -: ශේෂ පිරික්සුම
ගුරුවරයාගේ නම -: D.G.R.රත්නසිරි
විෂය -: ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය 10 ශ්‍රේණිය
පාසල -: කලාප අධ්‍යාපන කාර්යාලය.

01) ශේෂ පිරික්සුම පිළිබඳ වඩාත් නිවැරදි අදහස ගෙන දෙන ප්‍රකාශය තෝරන්න.

I. යම් කාලච්ඡේදයක් අවසානයේ ලෙජර ගිණුම් වල ශේෂ දක්වන ලියවිල්ලයි.
II. ලෙජර ගිණුම් වල හර සහ බැර ශේෂ අතර වෙනස දක්වන ලියවිල්ලයි.
III. යම් කාලච්ඡේදයක් අවසානයේ ලෙජර ගිණුම් වල ශේෂ ඇතුළත් කර පිළියෙල කරන ලේඛනයකි.
IV. යම් කාලච්ඡේදයක් අවසානයේ ගිණුම් වල ශේෂ අතර වෙනස දක්වන ලියවිල්ලයි.

02) ද්විත්ව සටහන් නීතියට අනුව සටහන් තබන ශේෂ වල එකතුව සමාන වීමෙන් පෙන්නුම් කරනුයේ,

I. ගිණුම් නිවැරදිව තුලනය කර ඇති බව.
II. ගනුදෙනු නිවැරදිව සටහන් කර නැති බව.
III. අනිවාර්යෙන්ම ගිණුම සමාන විය යුතු බව.
IV. ගිණුමක හර සහ බැර සටහන් නිවැරදි බව.

03) පහත සඳහන් වන්නේ සිරිදාසගේ ව්‍යාපාරයේ 2021/01/10 දින සිදු වූ ගනුදෙනුවකි.
"රු.20 000 ක් යොදවා බැංකු ජංගම ගිණුමක් ආරම්භ කිරීම."

I. බැංකු ගිණුම හර රු.20000 - බැංකු ජංගම ගිණුම බැර රු.20000
II. සිරිදාසගේ ගිණුම හර රු.20000 - බැංකු ගිණුම බැර රු.20000
III. බැංකු ගිණුම හර රු.20000 - මුදල් ගිණුම බැර රු.20000
IV. සිරිදාසගේ ගිණුම හර රු.20000 - මුදල් ගිණුම බැර රු.20000

04) වෙළඳ භාණ්ඩ තොගයක් ණයට ගැනීම සම්බන්ධයෙන් සටහන් තැබීමේදී භාවිතා වන ගිණුම් වන්නේ,

I. ගැණුම් ගිණුම හා මුදල් පොත
II. මුදල් පොත හා ණයගැති ගිණුම
III. මුදල් පොත හා ණයහිමි ගිණුම
IV. ගැණුම් ජර්නලය හා ණයහිමි ගිණුම

05) ශේෂ පිරික්සුමක් පිළියෙල කරන්නේ,

I. කිසියම් කාලච්ඡේදයක් සඳහාය
II. ව්‍යාපාරයේ ආරම්භයේදීය
III. නිශ්චිත දිනකටය
IV. ගිණුම් වර්ෂය අවසානයේදීය

06) ප්‍රාග්ධන ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමේ සටහන් තැබීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න

I. හරට සහ බැරට යන දෙපැත්තටම සටහන් වේ.
II. ප්‍රාග්ධන ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට ඇතුළත් නොවේ.
III. ශේෂ පිරික්සුමේ හරට සටහන් තැබේ.
IV. ශේෂ පිරික්සුමේ බැරට සටහන් තැබේ.

07) 2021/01/10 සිරිදාසගේ ව්‍යාපාරයෙන් ඉමාෂා විසින් රු.25000 ණයට භාණ්ඩ ගෙන ඇත.ඊට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

I. සිරිදාසගේ ව්‍යාපාරය හර රු.25000 - විකුණුම් ගිණුම බැර රු.25000
II. මුදල් පොත හර රු.25000 - විකුණුම් ගිණුම බැර රු.25000
III. ඉමාෂා ණයගැති ගිණුම හර රු.25000 - විකුණුම් ගිණුම බැර රු.25000
IV. ණයහිමි ගිණුම හර රු.25000 - විකුණුම් ගිණුම බැර රු.25000

08) බැංකු ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමේ සටහන් වන්නේ,

I. ශේෂ පිරික්සුමේ සටහන් නොවේ.
II. ශේෂ පිරික්සුමේ හර පැත්තේ සටහන් වේ.
III. ශේෂ පිරික්සුමේ හරට සහ බැරට සටහන් වේ.
IV. ශේෂ පිරික්සුමේ බැරට සටහන් වේ.

09) ව්‍යාපාරයක දුන් වට්ටම් ශේෂ පත්‍රයට සටහන් තැබීමේදී සලකන්නේ,

I. වියදම් ගිණුමක් ලෙසයි.
II. ආදායම් ගිණුමක් ලෙසයි.
III. වත්කම් ගිණුමක් ලෙසයි.
IV. වගකීම් ගිණුමක් ලෙසයි.

10) පහත දැක්වෙන ගිණුම් ශේෂ ශේෂ පිරික්සුමේ නිවැරදිව සටහන් කර ඇති ආකාරය දක්වන්නේ,

විකුණුම් ගිණුමේ ශේෂය රු.10000
මුදල් ගිණුමේ ශේෂය රු.15000
ණයහිමි ගිණුමේ ශේෂය රු.5000

I. විකුණුම් ශේෂ පිරික්සුම හර/මුදල් ශේෂ පිරික්සුම හර/ණයහිමි ශේෂ පිරික්සුම බැර
II. විකුණුම් ශේෂ පිරික්සුම හර/ මුදල් ශේෂ පිරික්සුම බැර/ණයහිමි ශේෂ පිරික්සුම බැර
III. විකුණුම් ශේෂ පිරික්සුම බැර/ මුදල් ශේෂ පිරික්සුම බැර/ණයහිමි ශේෂ පිරික්සුම හර
IV. විකුණුම් ශේෂ පිරික්සුම බැර/ මුදල් ශේෂ පිරික්සුම හර/ණයහිමි ශේෂ පිරික්සුම බැර

## <u>II කොටස</u>

01) සංජීවගේ ව්‍යාපාරය 2021/01/01 දින ආරම්භ කරන ලදි.එය 2021/06/30 දිනට ලෙජර් ගිණුම් තුලනය කර ලබා ගත් ශේෂ පහත දැක්වේ.

| | |
|---|---|
| 2021/01/01 දින ප්‍රාග්ධනය | 100 000 |
| මුදල් | 10 000 |
| ගැනුම් | 25 000 |
| ණයගැතියන් | 15 000 |
| යන්ත්‍ර | 50 000 |
| ණයහිමියන් | 10 000 |
| දුන් වට්ටම් | 5 000 |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 5 000 |
| ආයෝජන ආදායම් | 7 000 |
| කඩ කුලී | 5 000 |
| රක්ෂණ ගාස්තු | 2 000 |

ඉහත තොරතුරු ඇතුළත් කර සංජීවගේ ව්‍යාපාරයේ 2021/06/30 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## 10 ශ්‍රේණිය

## ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම

නම - ඒ.එම්. මොහාන් සමරවීර පාසල - අම්/කාවන්තිස්ස මහා විද්‍යාලය

## 1 කොටස

❖ නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. අවිනිශ්චිත ගිණුමේ සටහන් කිරීමට සිදුවන ගිණුම්කරණ වරදක් වන්නේ,
   (1) ගනුදෙනුවක ද්විත්ව සටහනෙන් එක් සටහනක් පමණක් ඇතුළත් වීම.
   (2) එකම ගනුදෙනුව ගිණුම් පොත්වල දෙවරක් සටහන් වීම.
   (3) ගනුදෙනුවක වටිනාකම මූලික පොත්වල වැරදියට සටහන් වීම.
   (4) ගනුදෙනුවක් සම්පූර්ණයෙන් ම පොත්වලින් මගහැරීම.

2. අවිනිශ්චිත ගිණුම සම්බන්ධ වැරදි ප්‍රකාශය වනුයේ,
   (1) ශේෂ පිරික්සුමේ වෙනස තාවකාලිකව සටහන් කරන ගිණුමයි.
   (2) ශේෂ පිරික්සුමේ වෙනස ඇති වීමට බලපාන වැරදි නිවැරදි කරන ගිණුමයි.
   (3) ශේෂ පිරික්සුමේ වෙනසට හේතු වූ වැරදි නිවැරදි කළ පසු මෙම ගිණුමේ ශේෂය ද ඉවත් ව යා යුතුය.
   (4) මෙම ගිණුම තාවකාලිකව ඇති කරන ගිණුමකි.

3. යන්ත්‍ර අළුත්වැඩියා වියදම රු. 8 000 යන්ත්‍ර ගිණුමට හර කිරීම වරද නිවැරදි කිරීමේ සටහන වනුයේ,
   (1) යන්ත්‍ර ගිණුම හර යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම බැර
   (2) යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම හර යන්ත්‍ර ගිණුම බැර
   (3) අවිනිශ්චිත ගිණුම හර යන්ත්‍ර ගිණුම බැර
   (4) යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම හර මුදල් පොත බැර

4. පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමක හර හා බැර තීරුවල එකතු සමාන වීම තුළින් අනාවරණය වන්නේ,
   (1) ගනුදෙනු සියල්ල නිවැරදිව සටහන් කර ඇති බවය.
   (2) ගනුදෙනු සටහන් කිරීමේ ගණිතමය නිවැරදිතාව හරි බවය.
   (3) ගණුදෙනු සටහන් තැබීමේ දී වැරදි සිදු වී ඇති බවය.
   (4) ඉහත සියල්ලම නිවැරදි බවය.

5. ශේෂ පිරික්සුම තුළින් හෙළිදරව් නොවන වරදක් වන්නේල
   (1) රු 1000 විදුලි බිල ගෙවීම මුදල් පොතේ බැර පැත්තේ සටහන් කර ඇතත් වෙනත් කිසිදු සටහනක් නොවීම.
   (2) චාමරගෙන් ලැබුණු රු. 450 මුදල්ල මුදල් පොත හර රු. 450 ද චාමරගේ ගිණුමට රු. 540 ලෙස සටහන් කිරීම.
   (3) රු. 5000 වටිනා ලී බඩු මිලදී ගැනීම රු. 50000 ලෙස ගිණුම් වල සටහන් කිරීම.
   (4) රු. 2000 වූ විකුණුම් රු. 2200 ලෙස විකුණුම් ගිණුමට බැර කිරීම.

6. ගැනිලි ගිණුම තුලනය කිරීමේ දී රු. 500 ක් අඩුවෙන් සටහන් වීමේ වරද නිවැරදි කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,
   (1) ගැනිලි ගිණුම හර, ගැනුම් ගිණුම බැර
   (2) අවිනිෂ්චිත ගිණුම හර, ගැනිලි ගිණුම බැර
   (3) ගැනුම් ගිණුම හර, ගැනිලි ගිණුම බැර
   (4) ගැනිලි ගිණුම හර, අවිනිෂ්චිත ගිණුම බැර

7. ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීමේදී භාවිතා කරන මූලික පොත වන්නේ,
   (1) ගැනුම් ජර්නලය
   (2) පොදු ජර්නලය
   (3) මුදල් පොත
   (4) විකුණුම් ජර්නලය

8. ව්‍යාපාරයක් පිළියෙල කල ශේෂ පිරික්ෂුමේ බැර තීරුවේ එකතුව, හර තීරුවේ එකතුවට වඩා 15 000 ක් අඩුය. එම වෙනසට හේතු විය හැකි වරද වන්නේ,
   (1) විකුණුම් ගිණුමේ එකතුව රු. 15 000 ක් අඩු වීම.
   (2) ප්‍රාග්ධන ගිණුමේ එකතුව රු. 15 000 ක් වැඩි වීම.
   (3) පොලී ආදායම් ගිණුමේ එකතුව රු. 15 000 ක් වැඩි වීම.
   (4) විදුලි වියදම් ගිණුමේ එකතුව රු. 15 000 ක් අඩු වීම.

10. වරද නිවැරදි කිරීමේ දී අවිනිෂ්චිත ගිණුමේ හර පැත්තේ රුග 10 000 ක් ලෙස සටහන් කරනු ලබන ගිණුම්කරණ වරද වන්නේ,
   (1) රු. 10 000 දුරකථන ගාස්තු ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් කර තිබීම
   (2) ණයගැතියෙකුගෙන් ලැබුණු රු. 5 000 ක් මුදල් පොතට හර කර ණයගැති ගිණුමට ද හර කර තිබීම්
   (3) ගැනුම් ගිණුමේ නිවැරදි එකතුව වූ රු. 15 000 ක් රු. 5 000 ක් ලෙස ගැනුම් ගිණුමේ සටහන් කිරීම
   (4) රු. 10 000 ක් වූ ගොඩනැගිලි කුලී ආදායම් ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමේ සටහන් වී නැත.

9. රු. 54 000ක අත්පිට විකුණුම් මුදල් පොතේ නිවැරදි ව සටහන් කර විකුණුම් ගිණුමට රු. 45 000ක් ලෙස බැර කිරීමේ වරද නිවැරදි කිරීම අවිනිශ්චිත ගිණුමේ සටහන් කරන ආකාරය වන්නේ,
(1) හර 9 000 (2) බැර 9 000 (3) හර 45 000 (4) බැර 54 000

11. ශේෂ පිරික්සුමෙහි වෙනසක් ඇති වූ විට එම වෙනස තාවකාලිකව ඇතුළත් කරනුයේ,
(1) ප්‍රාග්ධන ගිණුමේ ය. (2) අවිනිශ්චිත ගිණුමේ ය.
(3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ය. (4) මුදල් පොතේ ය.

12. අමල්ට විකුණන ලද රු. 4 000 ක වටිනාකමක් සහිත භාණ්ඩ කමල්ගේ ගිණුමේ සටහන් වීම නිසා,
(1) ශේෂ පිරික්සුමෙහි සමානතාවට බලපෑමක් නොවේ. (2) හර තීරුව රු. 4 000 කින් වැඩි වේ.
(3) බැර තීරුව රු. 8 000 ක් අඩු වේ. (4) හර හා බැර තීරු එකිනෙකට සමාන නොවේ.

13. පොදු ජර්නලය භාවිතා කර සටහන් කරනු ලබන ගනුදෙනුවක් වන්නේ,
(1) මුදලින් සිදුවන ගනුදෙනු සටහන් තැබීමට (2) භාණ්ඩ තොගයක් ණයට ගැනීම සටහන් තැබීමට
(3) භාණ්ඩ තොගයක් ණයට විකිණීම සටහන් තැබීමට (4) ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම සටහන් තැබීමට

14. තුලනය නොවූ ශේෂ පිරික්සුමක වෙනස නිවැරදි කිරීම සඳහා එම වෙනස තාවකාලිකව සටහන් කරනු ලබන ගිණුම,
(1) ලාභඅලාභ ගිණුමයි (2) අවිනිශ්චිත ගිණුමයි
(3) වෙළඳ ගිණුමයි (3) වගකීම් ගිණුමයි

15. යන්ත්‍ර අලුත්වැඩියාවට වැය වූ රු.6 000 යන්ත්‍ර ගිණුමේ හරට සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම යන සංලක්ෂයට අදාළව පැවති ජර්නල සටහන වන්නේ,
(1) යන්ත්‍ර ගිණුම හර රු.6 000 මුදල් බැර රු.6 000
(2) අවිනිශ්චිත ගිණුම හර රු.6 000 යන්ත්‍ර ගිණුම බැර රු.6 000
(3) යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම හර රු.6 000 අවිනිශ්චිත ගිණුම බැර රු.6 000
(4) යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම හර රු.6 000 යන්ත්‍ර ගිණුම බැර රු.6 000

## 11 කොටස

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. (අ) ගිණුම්කරණ වැරදි සිදුවිය හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න ?
(ආ) අවිනිෂ්චිත ගිණුම යනු කුමක්දැයි හඳුන්වන්න.

2. (අ) ගිණුම්කරණ වැරදි හඳුනාගන්නා ප්‍රධාන කොටස් දෙක කුමක්ද ?
(ආ) ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ දී සිදුවන ගිණුම්කරණ වැරදි දෙකක් සඳහන් කරන්න.

3. පහත ප්‍රකාශ සත්‍යයද අසත්‍යයද යන්න දක්වන්න.
(1) ශේෂ පිරික්සුමක හර හා බැර තීරුවල එකතු සමාන වුව ද ගිණුම්කරණ ක්‍රියාවලියේ දෝෂ තිබීමට පුලුවන.
(2) ගනුදෙනුවක් සම්පූර්ණයෙන් ම පොත්වලින් මගහැරීම ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපාන වරදකි.
(3) සියලු ගිණුම්කරණ වැරදි නිවැරදි කරන විට අවිනිශ්චිත ගිණුමේ ද සටහන් තැබිය යුතු ය.
(4) ශේෂ පිරික්සුමක හර හා බැර තීරුවල එකතු සමාන වීම තුළින් ගනුදෙනු සියල්ල නිවැරදිව සටහන් කර ඇති බව අනාවරණය වේ.

4. පහත ගිණුම්කරණ වැරදි ශේෂ පිරික්සුමේ තුලනයට බලපානේනේද නැද්ද යන්න සඳහන් කරන්න.
(1) රු. 6 000 ක දුරකථන ගාස්තු ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් කර තිබීම.
(2) විදුලි ගාස්තු ගිණුමේ ශේෂය වූ රු. 16 000 ශේෂ පිරික්සුමට උපුටාගෙන නැත.
(3) රු. 30 000ක බැංකු ණය පියවීම සටහන් කොට ඇත්තේ මුදල් පොතේ පමණි.
(4) යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට වැය කරන ලද රු. 20 000 ක් යන්ත්‍ර ගිණුමට හර කර ඇත.
(5) රු. 25 000ක ණයට විකුණුම් ගිණුම් පොත්වලින් මගහැරී ඇත.

5. තරිඳුගේ ව්‍යාපාරයේ 2020/03/31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව එකිනෙකට සම නොවූයෙන් එහි වෙනස වූ රු. 4 200 අවිනිශ්චිත ගිණුමට බැර කරන ලදී. පසුව කළ සොයා බැලීමක දී පහත වැරදි සොයාගෙන ඇත.
(1) රු. 6 000 ක රක්‍ෂණ වාරික ගෙවීම රක්‍ෂණ වාරික ගිණුමේ නිවරදිව සටහන් කර ඇතත් මුදල පොතේ නැත.
(2) රු. 3 200 ක කඩකුලී ශේෂ පිරික්සුමට ගෙන නැත.
(3) විකුණුම් ගිණුම බැර පැත්ත රු. 600 ක් වැඩිපුර එකතු කර ඇත.
(4) රු. 20 000 ක් වූ මෝටර් රථ අලුත්වැඩියා වියදම් මෝටර් රථ ගිණුමට හර කර ඇත.
(5) රු. 5 000 ක් වූ වැටුප් ගෙවීම විදුලි වියදම් ගිණුමට හර කර ඇත.
(6) ලද කොමිස් රු. 1 000 ක් මුදල් පොත හර කරල ලද කොමිස් ගිණුමට ද හර කර ඇත.
අවශ්‍ය වන්නේ,
(අ) වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් (ආ) අවිනිශ්චිත ගිණුම